| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.04.17 පැය 1135 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/ 757/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**මහා පරිමාණ කේරළ ගංජා වැටලීමක් - විශේෂ කාර්‍ය බලකා උතුරු පළාත් විශේෂ වැටලීම් ඒකකය.**

වැඩබලන පොලිස්පතිතුමාගේ උපදෙස් පරිදි දිවයින පුරා ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකා පොලිසිය සිදුකරගෙන යනු ලබන අපරාධ හා මත්ද්‍රව්‍ය නිවාරණ මෙහෙයුමට අදාළව 2025.04.17 වන දින අළුයම් කාලයේ විශේෂ කාර්‍ය බලකා උතුරු පළාත් විශේෂ වැටලීම් ඒකකයේ නිලධාරීන් කණ්ඩායමට ලද තොරතුරක් මත අඩම්පන් පොලිස් වසමේ මන්නාරම - යාපනය ප්‍රධාන මාර්ගයේ වෙටයාන්මුරිප්පු ප්‍රදේශයේ වැටලීමක් සිදුකර කේරළ ගංජා **කිලෝ 18 ග්‍රෑම් 200 ක් සමඟ සැකකරුවන් දෙදෙනෙකු හා මන්නාරම පොලිස් වසමේ මන්නාරම නරගයේ දී වැටලීමක් සිදුකර කේරළ ගංජා ග්‍රෑම් 200 ක් සන්තකයේ** තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන අඩම්පන් හා මන්නාරම පොලිස් ස්ථාන වෙත භාරදී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 32, 34 හා 50 වයස් වල පසුවන පුනරින්, පේසාලේ හා මන්නාරම ප්‍රදේශ වල පදිංචිකරුවන් වේ.**

අඩම්පන් හා මන්නාරම පොලිස් ස්ථාන වැඩිදුර විමශර්න පවත්වාගෙන යනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**